# 18 අන් වස්තු ආශා නොකරව

මිනිසා තුළ ස්වභාවයෙන් ම සිත් ඇද ගන්නා දේට ආශාවක්, කැමැත්තක් හා ඇල්මක් ඇත.

උදාහරණ : ප්‍රණීත ආහාරවලට දක්වන ආශාව
ලස්සන ඇඳුම්වලට ආශා කිරීම
අලංකාර නිවෙසක ජීවත් වීමේ ආශාව
සුඛෝපභෝගී රථයක හිමිකරුවකු වීමේ ආශාව

මෙම ආශාව, කැමැත්ත හා ඇල්ම හේතුකොටගෙන යම් යම් දේ තමන්ට ම කියා අයිති කර ගැනීමට මිනිසා පෙළඹෙයි. මෙම ආශාව, කැමැත්ත හා ඇල්ම තවත් කෙනෙකුට අයිති දේට ඇඳී යන විට, ඒ දේවල් තමන් වෙතට ලබා ගැනීමට අධික ආශාවක් හෙවත් තණ්හාවක් ඇති වේ. මෙලෙස තණ්හාව ඇති කර ගැනීම දසවන පනත කඩකිරීමකි. තණ්හා සිතුවිලි සොරකමට පොලඹවයි නම් එය සත්වන පනත කඩකිරීමකි.

ඒ අනුව, සත්වන හා දසවන පනත් අතර සම්බන්ධයක් ඇත. සත්වන පනතින් පුද්ගලයන් සිදු කරන ක්‍රියාව (සොරකම) තහනම් කරන අතර දසවන පනතින් එවැනි දේ කිරීමට යොමු කරන තණ්හාවට අවනත වීම පාපයක් බව උගන්වයි.

ඇමෙරිකාවේ ආදිවාසී රතු ඉන්දියානුවන් සතු ඉඩම්වලට තණ්හාව උපදවා ගත් ඇමෙරිකානු පාලකයන්ට සියැටෙල් දුන් පිළිතුරින් පෙන්වන්නේ ද තණ්හාව ඇති කර ගැනීමෙන්, පළමුව දසවන පනතත් දෙවනු ව සත්වන පනතත් කඩ කරන ආකාරය යි.

> වොෂිංටන් නගරයේ උතුමාණෙනි,
> අපේ රට මිලයට ගැනීමට ඔබතුමා කැමති බව අපට දන්වා තිබේ. ඔබතුමා අපට මිත්‍රශීලී හා හොඳ හිත ද ප්‍රකාශ කර ඇත. මෙය විකිණීමට අප කැමති නොවුනහොත් සුදු මිනිසා තුවක්කුව රැගෙන විත්, අප දේශය අල්ලා ගනු ඇතැයි අපි සිතමු.

එබැවින් අන් අයගේ වස්තුව පිළිබඳ තණ්හාවක් ඇති කර නොගෙන, ලද දෙයින් සතුටු වීමට මෙම පනතින් උගන්වයි. මේ පිළිබඳ ව "මහෝපදේශය" මෙසේ දැනුවත් කරයි.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

> අනුන්ගේ දේපළ අයුතු ලෙස ලබා ගන්නට ද තබා ගන්නට ද ආශා කිරීමත් අනුන්ගේ යහපත ගැන ඊර්ෂ්‍යා කිරීමත් එයින් තහනම් වන්නේ ය.
>
> (මහෝපදේශය 300)

තමා සතු දෙයින් තෘප්තිමත් වී දිවිගෙවීමට දසවන පනත උගන්වයි. අනුන්ගේ දේපළ අයුතු ලෙස ලබා ගන්නට ද තබා ගන්නට ද ආශා කිරීමත්, අනුන්ගේ දියුණුව ගැන ඊර්ෂ්‍යා කිරීමටත් තහනම් කරයි. කුඩා පැල්පතක දිවි ගෙවන්නකු තම නිවස ඉදිරියේ ඇති අලංකාර මාලිගාවක් බඳු නිවස බලා, එයට ඊර්ෂ්‍යා නොකර, ඔවුන්ගේ දියුණුව ගැන අවංක ව සතුටු විය හැකිනම් එම තැනැත්තා සැබෑ ම ශ්‍රේෂ්ඨයෙකි.

කෙසේ වෙතත් අන් අය සතු දේ සාධාරණ මාර්ගවලින් ලබා ගැනීම මෙම පනතට විරුද්ධ පාපයක් නොවේ (ක.ස.ධ 2537). උදාහරණයක් ලෙස වෙළෙඳපොලෙන් මුදල් ගෙවා රූපවාහිනියක් මිල දී ගැනීම දැක්විය හැකි ය.

පාපය සඳහා මිනිසා යොමු කරන මුල් ම සිතුවිල්ල තණ්හාව යි. මේ සිතුවිල්ල ක්‍රියාවට පෙරළෙන අතර එම ක්‍රියාව දෙවියන් වහන්සේගෙන් ද සහෝදරයාගෙන් ද අප සැම ඈත් කරවන බව මීකා දිවැසිවරයා පෙන්වා දෙයිඃ

> සිය යහන්වල වැතිර, නපුරු උපා හිතන මතන අයට වන විපතක මහත! පහන් වූ විට ඔවුන්ගේ අතේ බලය නිසා ඔව්හු ඒවා කරති. ඔව්හු තමන් ආසා කළ කෙත් බලහත්කාරයෙන් ගනිති; ගෙවල් ද පැහැර ගනිති. ඔව්හු මිනිසුන් සහ ගේදොර ද දේපළ ද සොරා ගනිති.
>
> (මීකා 2:1-2)

විශ්වය, දෙවියන් වහන්සේගේ මැවිල්ල යි. එම මැවිල්ලේ හිමිකරුවාණෝ දෙවියන් වහන්සේ ය. උන් වහන්සේ සතු අයිතිය ගැන අවබෝධයකින් ක්‍රියා කිරීම සඳහා නොඇලුම් බවකින් දිවි ගෙවීමට කතෝලික සභා ධර්මෝපදේශය මඟ පෙන්වයි.

ඊර්ෂ්‍යාව මුල් අගුණ පාපයකි. අන් වස්තු ආශා කිරීමෙන් ඊර්ෂ්‍යාව හට ගනියි. එය කරණකොටගෙන තමා තුළ දුකක් හා කලකිරීමක් ඇති වේ. එහෙත් ලද දෙයින් සතුටු වන්නේ නම්, එවැනි දුකක් හෝ කලකිරීමක් ඇති නොවේ.

මිනිසුන් වන අපට යමක් ලැබී ඇත්නම්, ඒ සියල්ල ලැබුණේ, දෙවියන් වහන්සේගෙනි. මෙලොව සදාකාලික ව දිවි ගෙවීමට අපට නොහැකි ය. එබැවින් ජීවත් වන කෙටි කාලය තුළ තමන් ලද සියල්ල ගැන දෙවියන් වහන්සේට ස්තුති පූර්වක හැඟීමෙන් නිරතුරු පසසමින් දිවි ගෙවීමට මෙම පනත මඟ පෙන්වයි.

මා සතු දේ ආරක්ෂා කිරීමට කැප වන්නා සේ, අන් අයගේ දේපළ හා වස්තුව ආරක්ෂා කිරීමට කිතුනු දරුවන් ලෙස ඇති වගකීම අවබෝධ කර ගත යුතු ය.

දසවන පනත ජීවත් කරවීමට පිළිපැදිය යුතු කරුණු

- ★ ලද දෙයින් සතුටු වීම
- ★ අන් අයගේ දේ පැහැර නොගැනීම
- ★ වෙළඳ කටයුතුවල දී සාධාරණ ව කටයුතු කිරීම
- ★ ලබන වැටුපට සරිලන සේ සේවය කිරීම
- ★ අනුන්ගෙන් ලබා ගත් දේ ආපසු දීම
- ★ අනුන් සතු දේ සම්බ වූ විට ඒවා අයිතිකරුවනට ලබා දීම
- ★ අනුන්ගේ දියුණුවේ දී ඊර්ෂ්‍යා නොකර ඔවුන් හා සතුටු වීම

**ක්‍රියාකාරකම**

1. "අන් වස්තු ආශා නොකරව" යන මාතෘකාව යටතේ වචන 75කට නොඅඩු රචනයක් ලියන්න.



**ජීවිතයට බිඳක්**

**ලද දෙයින් සතුටු වෙමු.**